නංගි මම පොඩ්ඩක් එහාට ගිහින් එන්නම් යැයි පවසා මාව පිළිගත් නැගණිය සමග එතරම් වේලාවක් දොඩමළු නොවී ඉක්මනින් එතනින් ඉවත් උනේ තරණි සමග කතා කිරීමේ අරමුණ ඇතිවය. මා තරණි අසලට යන විට ඇය එතනින් ඉවත්ව ගියේ මුකටියෙකු දකින නාගයකු මුකටියාගෙන් බේරී පලා යන්නක් මෙනි. ඇය හිමින් සීරුවේ වල දෙසට ඇදෙයි. අපි සරසවිය තුළ වල යැයි ව්‍යවහාර කරනුයේ එළිමහන් රංග පිටියටයි. එළිමහන් රංග පිටිය යනු ආර්ථික භාණ්ඩයකි. ආර්ථික භාණ්ඩයක් යන්න ආර්ථික විද්‍යාව තුළ නිර්වචනය කරනුයේ, සැපයුමේ හිගකමක් දක්නට ලැබෙන භාණ්ඩ වශයෙනි. නැතහොත් නිෂ්පාදනයේ දී ආවස්ථික පිරිවැයක් හට ගන්නා භාණ්ඩ ආර්ථික භාණ්ඩ වශයෙනි.

තරණි එළිමහන් රංග පිටිය නිර්මාණය වී ඇති ස්ථානයේ පවතින කොස් ගස අසලින් වාඩි වූයේ දෑස් එළිමහන් රංග පිටිය දෙසට යොමු කරමිනි. සරසවිය තුළ උසස් අධ්‍යාපනය ලබන සිසුන්ගේ කලා කුසලතාවන් වර්ධනය කර ගැනිමට මෙම ස්ථානය මනා තොතැන්නකි. සරසවිය යනු සිල්ලල සපිරුණු මනරම් රඟහලකි. මේ රඟහලේ රඟන සියල්ල අනාගත ශ්‍රම බලකායේ දයාදයන්ය. ශ්‍රී ලංකාව තුළ ශ්‍රම බලකාය නිර්වචනය කරනුයේ, වයස අවුරුදු 15 හා ඊට වැඩි සේවා නියුක්ත හා සේවා වියුක්ත සමස්ත ජනගහනය වශයෙනි. 2012 ශ්‍රී ලංකා මහ බැංකු වර්තාවට අනුව ශ්‍රී ලංකාවේ මධ්‍ය වාර්ෂික ( මැදි වසර) ජනගහනය 20,328,000 වේ. මෙයින් ශ්‍රම බලකායට අයත් වන්නේ 8,465,000 කි. ( සේවා නියුක්ත + සේවා වියුක්ත = 8,129,000 + ). සරසවි සිසුන් වන අප මෙම ශ්‍රම බලකාය තුළට ඇතුලත් නොවේ. මන්ද අපි පූර්ණ කාලීනව අධ්‍යාපනය ලබන්නන් වන නිසාවෙනි. අප හැරුණු විට අබාධිත පුද්ගලයින්, ගෘහණියන්, වයස්ගත පුද්ගලයන්, මෙන්ම පූජ්‍ය පක්ෂයද ශ්‍රම බලකාය තුළ අන්තර් ගත නොවේ. එ වැනි අය ආර්ථික වශයෙන් අක්‍රීය ජනගහනය වශයෙන් හඳුන්වයි. පූජ්‍ය පක්ෂයේ සියලුම දෙනා ශ්‍රම බලකායට ඇතුළත් නොවුන ද, වර්තමානයේ දේශපාලන කරලියේ කරනම් ගසන පූජ්‍ය පක්ෂයේ ඇතැම් අය වැටුපක් ලබන සේවා නියුක්තියක් අපෙක්ෂා නොකරන්නේ ද යන්න මා තුළ ඇත්තේ ප්‍රශ්නයකි.

මම ද ගොදුරක් පසු පස හඹායන්නක් මෙන් තරණි පසු පසින් එළිමහන් රංග පිටිය දෙසට ගියහ. එළිමහන් රංග පිටිය තුළ අමුතු වැඩක් වන බව පෙනේ. මගේ සිතට දැනුණේ මහත් වූ අස්වැසිල්ලකි. තරණි එළිමහන් රංග පිටියට පැමිණයේ මත් සමග දොඩමළු වීමට අකමැති නිසා නොව එළිමහන් රංග පිටිය තුළ සිදුවන දේ නැරඹීමට බව මට සිතුනි. ඒ අසලින් ඇසෙන්නේ අතුල අධිකාරි මහතාගේ ගීතයකි.

සොඩින් නෙළුම් මල ගෙනයන බතික් රන් පටින් දිදුලන ඇතින්නියේ …………
යදම් අමතකද පා බැදි විලංගුවේ... යදම් අමතකද පා බැදි විලංගුවේ...
සොඩින් නෙළුම් මල ගෙනයන බතික් රන් පටින් දිදුලන ඇතින්නියේ …………
යදම් අමතකද පා බැදි විලංගුවේ. යදම් අමතකද පා බැදි විලංගුවේ.

උදුන් හිසින් ඇණ ඇණ කොයි ලෙසිනේ කිරි බොන්ඩැයි. ඇතින්නියේ දරු සෙනහස ගාල් කලේ මංදැයි.
උදුන් හිසින් ඇණ ඇණ කොයි ලෙසිනේ කිරි බොන්ඩැයි. ඇතින්නියේ දරු සෙනහස ගාල් කලේ මංදැයි.
ඇතින්නියේ …………
ඇතින්නියේ දරු සෙනෙහස ගාල් කළේ මංදැයි.

සොඩින් නෙළුම් මල ගෙනයන බතික් රන් පටින් දිදුලන ඇතින්නියේ …………
යදම් අමතකද පා බැදි විලංගුවේ... යදම් අමතකද පා බැදි විලංගුවේ...

වටින් මහා සෙනඟ ඇවිදින් සාදු කියා වැන්දයි. නෙළුම් මලට නොවේ නොඹට නොඹ අම්මා හින්දයි.
වටින් මහා සෙනඟ ඇවිදින් සාදු කියා වැන්දයි. නෙළුම් මලට නොවේ නොඹට නොඹ අම්මා හින්දයි.
ඇතින්නියේ………
නෙළුම් මලට නොවේ නොඹට නොඹ අම්මා හින්දයි.

සොඬින් නෙළුම් මල ගිනියන බතික් රන් පටින් දිදුලන ඇතින්නියේ …………
යදම් අමතකද පා බැදි විලංගුවේ… යදම් අමතකද පා බැදි විලංගුවේ… යදම් අමතකද පා බැදි විලංගුවේ…
යදම් අමතකද පා බැදි විලංගුවේ…

මේම ගීතයත් සමඟ මට මතක් වූයේ මාව මෙතෙක් දුර රැගෙන ආ මගේ මැණියන්ය. ඇය මව සරසවිය තුලට එවන්න දවස් කීයක්නම් කුස ගින්නේ ඉන්න ඇද්ද. අම්මේ මම කැම්පස් පාස්යැයි පැවසූ විට ඇයගේ ඇස්වල පිරිතිබී පොළව සිපගත් කදුලු බිදු අදටත් සිත තුළට ගෙන දෙන්නේ මිහිරි වූ සතුටකි. එය වචන වලින් කියා නිම කළ නොහැකි තරම්ය.

එළිමහන් රංග පිටිය තුළ අපේ සහෝදර පිඨය විදි නාට්‍යක් රඟ දක්වයි. එළිමහන් රංග පිටිය තුළ නාට්‍යක් රඟ දැක්වුවද මගේ ඇස් රැදී ඇත්තේ තරණි දෙසය. තරණි කොස් ගසින් ලබා ගන්නා සුළගේ පහස ඇය අසලින් වාඩි වී මටත් ලබා ගත හැකිනම් යැයි මට හැගෙ, මම ද ඇය අසලින් වාඩි වී කොස් ගසේ සුලගේ පහස වින්දද එයින් කිසිවෙකුට කොස් ගසෙන් ලබා ගන්නා සුළගේ ආස්වාදයේ කිසිදු අඩුවක් සිදු නොවේ. එබැවින් නොමිලේම ලැබෙන සුලගේ ආස්වාදය ආර්ථික නොවන භාණ්ඩයක් හෙවත් නොමිල භාණ්ඩයකි. 2011 උසස් පෙළ විභාගයේ ආර්ථික නොවන භාණ්ඩ සම්බන්ධයෙන් අසා ඇති ගැටලුවට ලැබී තිබූ පිලිතුර වුයේ, ශුන්‍ය මිලක දී අසීමිත සැපයුමක් සහිත භාණ්ඩ ආර්ථික නොවන භාණ්ඩ වේ. නැතහොත් ආවස්ථික පිරිවැයකින් තොරව අසීමිත ප්‍රමාණයක් පාරිභෝජනය කළ හැකි භාණ්ඩ ආර්ථික නොවන භාණ්ඩ වේ. උදාහරණ - හිරු එළිය, වර්ෂා ජලය.

මගේ සිත පවසන්නේම තරණි අදලට ගොස් ඇය අසලින් වාඩි වී ඇය සමඟ පෙම් බස් දොඩමින් විදි නාට්‍ය නරඹන ලෙසය. එහෙත් ඇය සමඟ කෙලින්ම ගොස් කතා කිරීමට සිත තුළ ඇත්තේ චකිතයකි. මම සිත එක්තැන් කර ගනිමින් ඇය සිටින තැනට යාමට තීරණය කළෙමි.



01 ශ්‍රම බලකාය යනුවෙන් කුමක් අදහස් වේ ද ? ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාවේ එය ගණන් බලන්නේ කෙසේ ද ? මෑත වර්ෂවල එහි ඇස්තුමේන්තුගත අගය කොපමණ ද ?
02 සේවා වියුක්තිය සහ ඌණ සේවා නියුක්තිය අතර වෙනස පැහැදිලි කරන්න.
03 මෑත වර්ෂවල දී ශ්‍රී ලංකාවේ සේවා වියුක්තියෙහි දැකිය හැකි විශේෂිත ලක්ෂණ කවරේ ද ?
04 ශ්‍රී ලංකාවේ ශ්‍රම හමුදා සහභාගිත්වය ( ක්‍රියාකාරී ) අනුපාතිකය ගණනය කරන්නේ කෙසේ ද ?
05 ආර්ථික වශයෙන් අක්‍රිය ජනගහනය ඔබ නිර්වචනය කරන්නේ කෙසේ ද ?
06 නිව භාණ්ඩයක්, භාණ්ඩයක්, ආර්ථික භාණ්ඩයක් සහ ආර්ථික නොවන භාණ්ඩයක් යනාදිය අතර වෙනස්කම් දක්වන්න.

01 රටක ශ්‍රම බලකාය යනුවෙන් කුමක් අදහස් වේ ද ?
i වැඩ කල හැකි වයස්වල ජනසංඛ්‍යාව. ii සේවා නියුක්ත සහ සේවා වියුක්ත ජනසංඛ්‍යාව
iii ගෘහණියන් හැර වැඩිහිටි ජනසංඛ්‍යාව iv සේවා නියුක්ත ජනසංඛ්‍යාව

02 සේවා වියුක්ත ජනගහනයෙන් කොටසක් සක්‍රීය ලෙස රැකියා අපේක්ෂා කිරීම අත්හැර දමනු ලැබුහොත් පහත සඳහන් දෑ අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රතිඵලය දැක්වෙන සංයෝගය කුමක් ද ?

| ශ්‍රම බලකායේ ප්‍රමාණය | ශ්‍රම සහභාගිත්ව අනුපාතිකය | සේවා වියුක්ත අනුපාතිකය |
|---|---|---|
| වැඩි වේ. | වැඩි වේ. | වැඩි වේ. |
| අඩු වේ. | අඩු වේ. | අඩු වේ. |
| අඩු වේ. | වැඩි වේ. | අඩු වේ. |
| වැඩි වේ. | අඩු වේ. | වැඩි වේ. |
| අඩු | අඩු වේ. | වැඩි වේ. |

03 දෙන ලද අවස්ථාවක් සඳහා කල්පිත ආර්ථිකයක ජනගහනය හා ශ්‍රම හමුදාවට අදාළ දත්ත සමහරක් පහත දැක්වේ.

| ජනගහකය ( මිලියන) | වයස අවුරුදු 15 හා ඊට වැට වැඩි ජනගහනය (මිලියන) | සේවා නියුක්ත ප්‍රමාණය ( මිලියන) | සේවා වියුක්ත ප්‍රමාණය ( මිලියන) |
|---|---|---|---|
| 50 | 25 | 15 | 5 |

04 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් මෙම ආර්ථිකය සඳහා නිවැරදි ප්‍රකාශය කුමක් ද ?
i සහභාගිත්ව අනුපාතිකය 50% ක් සහ විරැකියා අනුපාතිකය 20% කි.
ii සහභාගිත්ව අනුපාතිකය 40% ක් සහ විරැකියා අනුපාතිකය 20% කි.
iii සහභාගිත්ව අනුපාතිකය 60% ක් සහ විරැකියා අනුපාතිකය 25% කි.
iv සහභාගිත්ව අනුපාතිකය 60% ක් සහ විරැකියා අනුපාතිකය 20% කි.
v සහභාගිත්ව අනුපාතිකය 60% ක් සහ විරැකියා අනුපාතිකය 25% කි.

05 කිසියම් රටක වැඩකරන වයසේ ජනගහනයේ ප්‍රමාණය මිලියන 130 ක් ද, සේවා නියුක්ති ජනගහනයේ ප්‍රමාණය මිලියන 90 ක් ද, විරැකියාවෙන් සිටින ජනගහනයේ ප්‍රමාණය මිලියන 10 ක් ද වේ. එම රටේ විරැකියා ප්‍රතිශතය කොපමණ ද ?
i 5.0% කි. ii 7.1 කි. iii 7.7% කි. iv 10.0 % කි. v 13.0% කි.

06 දෙන ලද අවස්ථාවක එක්තරා ආර්ථිකයක ජනගහනයේ ශ්‍රම හමුදාවේ ප්‍රමාණය පහත දැක්වේ.

| ජනගහකය ( මිලියන) | වයස අවුරුදු 15 හා ඊට වැඩි වැඩිකරන ජනගහනය (මිලියන) | සේවා නියුක්ත ප්‍රමාණය ( මිලියන) | සේවා වියුක්ත ප්‍රමාණය ( මිලියන) |
|---|---|---|---|
| 30 | 15 | 9 | 3 |

ඉහත දත්තවලට අනුව සහභාගිත්ව අනුපාතිකය හා විරැකියා අනුපාතිකය පිළිවෙළින්

i 50% හා 20% වේ. ii 60% හා 25% වේ iii 60% හා 20% වේ

iv 80% හා 25% වේ. v 50% හා 25% වේ.

08 කල්පිත ආර්ථිකයක සේවා නියුක්තියහා සේවා වියුක්තිය පිළිබඳ දත්ත පහත වගුවේ දැක්වේ.

| ගණන | සංඛ්‍යාව ( මිලියන) |
|---|---|
| ජනගහනය | 170 |
| සේවා නියුක්තිය | 95 |
| සේවා වියුක්ත හා රැකියා සොයන | 5 |
| රැකියාවක් බලාපොරොත්තු නොවන | 3 |
| විශ්‍රාමික | 60 |

මෙම ආර්ථිකයේ විරැකියා අනුපාතිකය,

i 5.3% කි. ii 5.0% කි. iii 4.8% කි. iv 3.0% කි. v 2.9% කි.

09 විරැකි අනුපාතිකය යනු, සේවා වියුක්ත ජනගහනයේ ප්‍රමාණය,

i වැඩ කළ හැකි වයසේ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස දැක්විමයි.

ii ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස දැක්විමයි.

iii සේවා නියුකත ජනහනයේ ප්‍රතිශතයක් ලෙස දැකිවිමයි.

v සේවා නියුක්ත හා රැකියාවක් අපේක්ෂාවෙන් සිටින ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස දැක්විමයි.

